# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1455 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 21/11/2023<br>පැය 0815 |

## මාධ්‍ය නිවේදනය

**01. පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට සාපරාධී බලහත්කාරය පෑම සම්බන්ධයෙන් සැකකරුවෙකු අත්අඩංගුවට - වැලිමඩ පොලිස් ස්ථානය.**

2023.10.24 වන දින වැලිමඩ පොලිස් වසමේ කැප්පෙටිපොල නගරයේ ආරක්ෂක රාජකාරී සහ රථ වාහන හැසිරවීමේ රාජකාරි යෙදී සිටි පොලිස් නිලධාරීන් දෙදෙනෙකුට සාපරාධී බලහත්කාරය පෑම සම්බන්ධයෙන් වැලිමඩ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයෙකු අත්අඩංගුවට ගැනීම සඳහා වැලිමඩ පොලිස් ස්ථානය විමර්ශන ආරම්භ කර තිබිණි.

සිද්ධියෙන් පසු සැකකරු ප්‍රදේශයෙන් පලාගොස් සැඟව සිට ඇති අතර, සැකකරු 2023.11.20 වන දින වැලිමඩ ගරු මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත්වීමෙන් පසු 2023.12.04 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත.

**සැකකරු වයස අවුරුදු 60 ක් වන කැප්පෙටිපොල ප්‍රදේශයේ පදිංචි වැලිමඩ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයෙකි.**

වැලිමඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. පොලිස් නිලධාරියෙකු රිය අනතුරකින් තුවාල ලැබීමක් - මීරිගම පොලිස් ස්ථානය.**

2023.11.20 වන දින උදෑසන කාලයේ මීරිගම පොලිස් වසමේ පස්යාල ගිරිඋල්ල ප්‍රධාන මාර්ගයේ මීරිගම පොලිස් ස්ථානය අසල පදික මාරුව මතදී මීරිගම දෙස සිට පස්යාල දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක ගැටී පොලිස් නිලධාරියෙකු තුවාල ලබා ප්‍රතිකාර සඳහා මීරිගම රෝහලට ඇතුලත් කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 48 ක් වන අලව්ව ප්‍රදේශයේ පදිංචි මීරිගම පොලිස් ස්ථානයට අනුයුක්ත ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙකි.**

තුවාලකරු පදික මාරුව හරහා ගමන් කරමින් සිටියදී ත්‍රීරෝද රථය අපරික්ෂාකාරීව හා නොසැලකිලිමත් ලෙස ධාවනය කර ඇති බව සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. අනතුර සම්බන්ධයෙන් වත්තේගෙදර ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 21 ක් වූ ත්‍රීරෝද රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මීරිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - දවුලගල පොලිස් ස්ථානය.

2023.11.20 වන දින රාත්‍රි කාලයේ දවුලගල පොලිස් වසමේ ගම්පොල නුවර ප්‍රධාන මාර්ගයේ පිටවලවත්ත ප්‍රදේශයේ මාර්ගයේ නාඳුනන පිරිමි පුද්ගලයෙකුගේ මෘත ශරීරයක් ඇති බවට දවුලගල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

මෙය රිය අනතුරක් හේතුවෙන් සිදුවූ මරණයක් බවට දැනට සිදුකරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇති අතර, අනතුරට සම්බන්ධ වාහනය අනතුරින් පසු පලාගොස් ඇත. මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරුවී නොමැත. සිද්ධිය සම්බන්ධයෙන් දවුලගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දෙමටගොඩ පොලිස් ස්ථානය.

2023.11.20 වන දින උදෑසන කාලයේ දෙමටගොඩ පොලිස් වසමේ දෙමටගොඩ දුම්රියපොල අසලදී දෙමටගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 100** ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන දෙමටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

දෙමටගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීගොඩ පොලිස් ස්ථානය.

2023.11.20 වන දින සවස් කාලයේ මීගොඩ පොලිස් වසමේ හෝමාගම ඉන්ධනහල අසලදී මීගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 340** ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක්වූ මීගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මීගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**